බන්ධ/කො/ජනරාල් චක්‍රලේඛ අංක- 04 /2010

මගේ අංකය-කේ.08/මත්ද්‍රව්‍ය/2009,
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09,
2010-01-05

සියලුම බන්ධනාගාර අධිකාරීන් සහ
සහකාර බන්ධනාගාර අධිකාරීන් වෙත.

**<u>මත්ද්‍රව්‍ය චෝදනා සම්බන්ධයෙන් සිරදඬුවම් ලැබ බන්ධනාගාර ගතවූ සිරකරුවන් රඳවා තැබීම</u>.**

2004-01-29 වෙනි දින නිකුත් කරන ලද චක්‍රලේඛ අංක 03/2004 අමතරවයි.

මත්ද්‍රව්‍ය චෝදනා සම්බන්ධයෙන් වරදකරුවී බන්ධනාගාර ගතවන සිරකරුවන් රඳවා තැබීම සඳහා බන්ධනාගාර ආයතන වලට නිසි පරිදි මාරකර නොවන බවට මාවෙත වාර්තාවී ඇත. මෙවැනි තත්වයන් ඉදිරියේදී ඇති නොවන පරිදි මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධයෙන් බන්ධනාගාර ගතවුවන් සම්මුඛ පරීක්ෂණයට භාජනය කිරීමෙන් පසු වීරවිල එළිමහන් වැඩ කඳවුරට, පල්ලේකැලේ එළිමහන් වැඩ කඳවුරට හා තල්දෙන තරුණ වරදකරුවන්ගේ විශෝධන මධ්‍යස්ථානයට මාස 06 ට වැඩි අවු-03 දක්වා පළමු හා දෙවන වතාවට බන්ධනාගාර ගතවුවන් යැවිය යුතුය. එසේ යවනු ලබන පුද්ගලයින් වෙනත් නඩු හෝ පොලිස් පරීක්ෂණ නොමැත්තන් විය යුතුය.

එම ආයතනයන් 03 ට ඉහත සඳහන් පරිදි යැවීම සඳහා තෝරා ගනු ලබන පුද්ගලයින් පිළිබඳව පහත දැක්වෙන ආකෘතිය පරිදි සකස්කර සෑම මසකම 10 දිනට ප්‍රථම මාවෙත ලැබීමට සැලැස්විය යුතුය. මත්ද්‍රව්‍ය අබ්බැහිවුවන් පුනරුත්ථාපනය කිරීම සඳහා අධිකරණ නියෝග ලද පුද්ගලයින් පිළිබඳවද මෙම ආකෘතිය ප්‍රකාර තොරතුරු සඳහන් කර එවිය යුතුය.

*ආකෘතිය*

01. සිරකරුගේ අංකය හා නම

02. වරදේ ස්වභාවය

03. ප්‍රථම, දෙවන වතාව

04. දඬුවම් කාලය

05. දණ්ඩනයේ නියමය දිනය

06. නිදහස්වීමට නියමිත දිනය

07. රැඳවීමට නියමිත ආයතනය

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්.